**ශීර්ෂය - 025 - සීමා නිර්ණය කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 025 - සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර මුදල් රෙගුලාසි 127(5) ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්කම් පරීක්ෂණයට භාජනය වන බවට වගබලා ගැනීමට විධිවිධාන යෙදිය යුතු වුවද පළාත් පාලන ආයතන සීමා නීර්ණය කිරීමේ ජාතික කමිටුවේ වියදම් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු මඟින් පුනරාවර්ථන වැය විෂයයන් 10 ක හා එක් මූලධන වැය විෂයයක අයවැය ගත ප්‍රතිපාදන සියයට 12 සිට සියයට 2000 කින් වැඩිකරගෙන තිබුණි. | අදාල වැඩිවීම පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේ ජාතික කමිටුව වෙනුවෙන් ලද ප්‍රතිපාදන නිසා සිදුව ඇත. | 2023 වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී 03/2022 චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කර මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) වැය විෂයයන් 03 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තුව මඟින් වෙන් කරගෙන තිබූ රු.1,088,000 ක්වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරිවී තිබුණි | අදාල පරිපූරක ඇස්තමේන්තු පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේ ජාතික කමිටුව වෙනුවෙන් ලද ප්‍රතිපාදන වේ . | වියදම් අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කර පරිපූරක ඇස්තමේන්තු මඟින් මුදල් වෙන් කර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) පුනරාවර්ථන වැය විෂයයන් 05 ක එකතුව රු.10,203,060 ක්වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.3,051,927 ක් ඉතිරිවී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 50 දක්වා පරාසයක පැවතුනි. | 2024.01.10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක :01/2024 අනුව වියදම් සීමා කිරීම නිසාත් පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේ ජාතික කමිටුව වෙනුවෙන් ලද ප්‍රතිපාදන නිසාත් ඉතිරිවීම් සිදුව ඇත. | 2023 වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී 03/2022 චක්‍රලේඛය කෙරෙහි අවදානය යොමු කර මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ ජනවාරි මාසයේ ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු.5,761 ක්වූ දුරකථන බිල් පත්‍ර ගෙවීම මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදි ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැරකම් බැරකම් වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වීම |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1)95ව්‍යවස්ථාව අනුව පවරා ඇති කාර්යභාරය හැර වෙනත් නිශ්චිත වෙනත් කාර්යභාරයක් නොමැති බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මානව ,අනුව 2018/02 සැලැස්ම සක සම්පත්ස් නොකරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදයෙන් ඉදිරිපත් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ආකෘතිය ප්‍රකාරව නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී . | චක්‍රලේඛයේ ආකෘතිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබුණු කාර්යයන් 16 න් කාර්යයන් 14 ක භෞතික ඉලක්කයන් සඳහන් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී භෞතික ඉලක්කයන් සඳහන් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී . | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් කාර්යයන් සඳහා භෞතික ඉලක්කයන් සඳහන් කළ යුතු වීම. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාව 2015 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මගින් කොමිෂන් සභා සාමාජිකයින් පත්කිරීම් හා මැතිවරණ කොට්ඨාශ වෙන් කිරීම් සම්බන්ධයෙන් පැහැදිලි කර තිබුණද කොමිෂන් සභාවේ කාර්යභාරය හා බලතල සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සදහන් කර නොතිබුණි. මෙසේ කොමිෂන් සභාව සම්බන්ධයෙන් කාර්යභාරයක් පවරා නොතිබුණද කොමිෂන් සභාව වෙත විසර්ජන පනත මගින් 2023 වර්ෂය සදහා රු.27,041,060 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් රු.21,293,574 ක් වැයකර තිබුණි. | කාර්යභාරයක් මේ වන තෙක් වෙන් කරදී නොමැති වුවද සීමා නිර්ණය කටයුතු වලට අවශ්‍ය දත්ත එක් රැස්කිරිම, පවත්නා දත්ත යාවත්කාලීන කිරිම මෙන්ම ගෝලීය වශයෙන් සීමා නිර්ණය කිරීමේදි සිදුකරන කාරය භාරයන් පිළිබඳව අධ්‍යයනයන් සිදු කිරිම ආදි කාර්යයන් හි දැනට සීමා නිර්ණය කොමිෂන් සභාව නිරතව සිටී. අවස්ථා කීපයකදි නිශ්චිත කාර්ය භාරයක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම් සඳහා මේ වන තෙක් ප්‍රතිචාර ලැබී නොමැත. විසර්ජන පනත මගින් වෙන් කරන ලද මුදල් සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වැටුප් සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන වියදම් වෙනුවෙන් දරන ලද වියදම් වන අතර නිශ්චිත කාර්ය භාරයක් මේ වනතෙක් පවරා නොමැති වුවද ඉදිරියේදි සීමා නිර්ණය කටයුතු වලට අදාල කාර්යයන් සඳහා අවශ්‍ය තොරතුරු හා දත්ත රැස්කිරීමේ කාර්යයන්හි කොමිෂන් සභාව නිරතව සිටින ලදී. | කොමිෂන් සභාවට නිශ්චිත කාර්යභාරය හා බලතල පවරා නොතිබීම පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| . (ආ) | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් 2016 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ කටයුතු සඳහා යොදාගෙන තිබුණි. විගණිත දිනය වන 2024 මාර්තු 31 දින දක්වාම මෙම වාහන දෙක කොමිෂන් සභාව වෙත පවරාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මෙම වාහන දෙක සඳහා ටයර් මිලදී ගැනීම හා අලුත්වැඩියා වියදම් වෙනුවෙන් කොමිෂන් සභාව විසින් රු.1,048,189 ක් වැය කර තිබුණි. | මෙම වාහන පවරා ගැනීමට කටයුතු කටයුතු කරන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2024.04.30 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර මේ වන විට ඒ අනුව ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. අදාල වාහන දෙකෙහි රක්ෂණාවරණ කටයුතු හා ආදායම් බලපත්‍ර ලබාදීම් පමණක් ජනාධිපති ලේකම් කාර්යාල ප්‍රතිපාදන යටතේ සිදුවූ අතර වාහන අලුත් වැඩියාවන් හා සේවා කටයුතු සීමා නිර්ණය කොමිෂන් සභාවේ ප්‍රතිපාදන මත සිදුකරන ලදී. | කොමිෂන් සභාව විසින් පරිහරණය කරන දේපල පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සැලසුම් කර සිදුකරනු ලබන කාර්යයන් වෙනුවෙන් වියදම් ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 (ආ) වගන්තිය ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දී ගෙවීම සිදුකල යුතු වුවද කොමිෂන් සභාව විසින් දිස්ත්‍රික්ක 5 ක පවත්වා තිබූ සීමා නිර්ණ කමිටු රැස්වීම් සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කර නොතිබූ අතර එම රැස්වීම් සඳහා නිලධාරීන් දෙදෙනෙකු විසින් ඉන්ධන සහ සංග්‍රහ කටයුතු සඳහා පිළිවෙලින් දරා තිබූ රු.55,300 ක් සහ රු.36,081 ක් පසුව ප්‍රතිපූරණය කර තිබුණි. | පලාත් පාලන සීමා නිර්ණය කමිටුව වෙනුවෙන් අදාල වියදම් දරන ලද අතර පලාත් පාලන සීමා නිර්ණය කමිටු වාර්තාව කඩිනමින් භාර දීම සඳහා ලබාදී තිබූ සීමිත කාල පරාසය සැලකිල්ලට ගෙන එම වියදම් පුද්ගලික මුදලින් දරා ප්‍රතිපූරණය කරන ලදී. | සැලසුම් කර සිදුකරනු ලබන කාර්යයන් සඳහා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දී ගෙවීම සිදු කළ යුතු වීම. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවයන්, ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පළකිරීමට තම නිල වෙබ් අඩවිය මගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් වෙබ් අඩවියක් පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | පනත ප්‍රකාරව නිල වෙබ් අඩවියක් පවත්වා ගත යුතු වේ. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයකු පත්කර අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්විය යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 15 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 08 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 07ක් පැවතුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර සඳහා 2016 වර්ෂයේ සිට ස්ථිර නිලධාරීන් පත් කර නොතිබුණු අතර ඒ සඳහා වැඩබැලීමේ පදනම මත නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |